## ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය - 2013

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1996 අංක 17 දරන ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩල පනතේ 24(3) වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 70 ඡේදය ප්‍රකාර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ජංගම හා ජංගම නොවන වත්කම් සහ ජංගම හා ජංගම නොවන බැරකම් පුළුල් ලෙස ද්‍රවශීලතාවයේ අනුපිළිවෙලට ඉදිරිපත් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ) 2013 දෙසැම්බර් 31 දින වන විටත් සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වී තිබූ ස්ථාවර වත්කම් අයිතම 368 ක් ප්‍රත්‍යාගණනය කර එම වටිනාකම් පොත්වල සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) එකතුව රු. 394,250 ක් වූ මෝටර් රථ අළුත්වැඩියා වියදම් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම් ගත කරනු වෙනුවට ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඇ) 2013 පෙබරවාරි 27 දින මණ්ඩලය විසින් අළුත් ගොඩනැගිල්ලක් අත්පත් කර ගෙන ප්‍රාග්ධනිත කර තිබුණද, මීට පෙර කුලී පදනම මත භාවිතා කර තිබූ මේ වන විට ආපසු භාර දී ඇති ගොඩනැගිල්ල වෙනුවෙන් වියදම් කරන ලද රු.286,033 ක් ස්ථාවර වත්කම් ලෙස ප්‍රාග්ධනිත කර ඒ සඳහා වර්ෂයටම ක්ෂය කර තිබුණි.

#### 2.2.3 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මුදල් වෙන්කර ගැනීමකින් සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව, රජයේ තක්සේරුව වූ රුපියල් මිලියන 165 ඉක්මවා මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාම සඳහා ගොඩනැගිල්ලක් විශ්‍රාම වැටුප් අරමුදලින් රු. මිලියන 195 කට මිලදීගෙන තිබුණි.

(ආ) විශ්‍රාම වැටුප් අරමුදලින් රු. 23,947,068 ක් වැය කර නව පරිගණක පද්ධතිය ස්ථාපිත කර තිබුණද, ඒ සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කර මිලදී ගැනීම් සිදු කර නොතිබුණි. එසේම 2013 දෙසැම්බර් 31 දින වන විට දායකයින්ගේ දායක මුදල් අය කිරිම හා ගිණුම්ගත කිරිම වර්ෂ ගණනාවක සිට ප්‍රමාදව සිදු වීම හා ආයතනය විසින් හඳුන්වා දෙන නව යෝජනා ක්‍රම පිලිබඳ තොරතුරු පරිගණක පද්ධතියට ඇතුලත් කිරීමට පහසුකම් නව පරිගණක පද්ධතිය තුල නොමැති වීම නිසා පරිගණක පද්ධතිය ස්ථාපනය කිරිමෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටු වී නොතිබුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි කළමනාකරණ තීරණවලට යොමුව | | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | (i) | මුදල් රෙගුලාසි 387 | චෙක්පත් මගින් කෙරෙන සියලුම ගෙවීම් සඳහා තම බැංකු ශේෂය ප්‍රමාණවත් දැයි ගෙවන නිළධාරියා විසින් සෑහීමකට පත්විය යුතු වුවද ජංගම ගිණුමක ශේෂය ඉක්මවා රු.4,262,296 ක චෙක්පත් ලියා තිබුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි 396 | ගෙවීමට තිබෙන සෑම චෙක්පතක්ම වලංගු කාලය අවසන් වූ විට එය නැවත වලංගු කිරීමට ආපසු එවන ලෙස ඉල්ලා හැකි තරම් ඉක්මනින් ආදායකයාට ලියා යැවිය යුතු වුවද එම කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමකින් තොරව මාස 06 ඉක්මවා තිබූ විශ්‍රාම වැටුප් වෙනුවෙන් නිකුත් කර තිබූ රු.151,712 ක් හා රු.641,115 ක් වටිනා චෙක්පත් ආදායම් ලෙස සලකා ගිණුම්වලට ගෙන තිබුණි. |
| (ආ) | 2004 ජුලි 29 දිනැති අංක පීඊඩී/25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | 2013 දෙසැම්බර් 31 දිනට පැවති රු. 1,622,672,141 ක ආයෝජන සඳහා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ අරමුදල් මෙහෙයුම්වලින් රු. 9,471,426 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු.18,535,954 ක ඌනතාවයක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.28,007,380 ක වර්ධනයක් දක්නට ලැබුණි. මෙම වර්ධනය සඳහා වාහන හා අනෙකුත් ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් රු. 2,272,800 ක ලාභයක් උපයා තිබීමත් විලම්භිත අයභාරය රු. 20,121,558 කින් වැඩිවීමත් නව ගොඩනැගිල්ල මිලදී ගැනීම නිසා කුලී වියදම රු. 8,545,004 කින් අඩුවීමත් ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

ඉකුත් වර්ෂයේදී රු.1,763,080,924 ක් වූ මුළු වත්කම් ප්‍රමාණය සමාලෝචිත වර්ෂයේදී රු.1,985,772,130 ක් දක්වා එනම් සියයට 13 කින්ද, ඉකුත් වර්ෂයේදී රු.1,698,821,952 ක්වූ අරමුදල් සමාලෝචිත වර්ෂයේදී රු. 1,948,247,878 ක් දක්වා එනම් සියයට 15 කින්ද වැඩි වී ඇත. තවද ඉකුත් වර්ෂයේදී රු. 64,258,972 ක් වූ මුළු වගකීම් ප්‍රමාණය සමාලෝචිත වර්ෂයේදී රු.37,524,252 ක් දක්වා එනම් සියයට 42 කින්ද අඩු වී තිබුණි.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, පෙර වර්ෂයේදී 4:1 ක්ව පැවති ජංගම අනුපාතය සමාලෝචිත වර්ෂයේ 5:1 ක් ලෙස ප්‍රසාරණය වී තිබූ බැවින්, ජංගම වත්කම්වල නිශ්ක්‍රීයව අරමුදල්

යෙදවීම තවදුරටත් ඉහල යාම නිසා මණ්ඩලයේ ජංගම වත්කම් කළමනාකරණය ප්‍රශස්ථ පරිදි සිදු වී නොතිබුණ බව නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

2013 වර්ෂයේ මණ්ඩලයේ කාර්යසාධනය පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2013 වර්ෂයේදී නව දායකයින් 25,000 ක් බඳවා ගැනීමට සැලසුම් කර තිබුණද සත්‍ය වශයෙන් බඳවා ගෙන තිබුණේ දායකයින් 9,139 ක් පමණි. එනම් බඳවා ගැනීම් ඉලක්කයෙන් සියයට 37 ක් පමණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දින වන විට සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් විශ්‍රාම වැටුප් ක්‍රමයන් සඳහා බඳවා ගෙන ඇති දායකයින් සංඛ්‍යාව 451,783 ක් වුවත් ඉන් දායකයින් 403,714 ක ප්‍රමාණයක්ම අක්‍රිය තත්වයේ පැවතිණි. ඒ අනුව 2013 දෙසැම්බර් 31 දිනට සක්‍රිය සාමාජික සංඛ්‍යාව සියයට 9 ක් පමණ විය.

(ඇ) 2013 වර්ෂයේ දායකයින් 1,396 දෙනෙක් විසින් තම සාමාජිකත්වය අවලංගු කර රු.10,367,065 ක දායක මුදල් ආපසු ලබා ගෙන තිබු අතර, 2012 වර්ෂයේ රු. 224,605,425 ක් වු දායක මුදල් ලැබීම් 2013 වර්ෂයේ රු. 161,397,701 ක් දක්වා එනම් සියයට 28 කින් පහල ගොස් තිබුණි.

(ඈ) දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යටතේ ශීර්ෂ 8 ක් ඔස්සේ දැනුවත් කිරීමේ වැඩසටහන් 30 ක් පවත්වා තිබුණ ද එම ලිපි ගොනු විධිමත්ව පවත්වා නොතිබුණි. මණ්ඩලය මෙන්ම එහි විශ්‍රාම වැටුප් ක්‍රම පිළිබඳ ශ්‍රී ලංකාව තුළ ඉතාමත් අඩු දැනුවත් භාවයක් පවතින බව නිරීක්ෂණය විය.

(ඉ) මණ්ඩල පනතට අවශ්‍ය සංශෝධන සිදු කිරීමට හා ඒ අනුව නව ගැසට් පත්‍රයක් ප්‍රකාශ කිරීමට සැලසුම් කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඊ) තොරතුරු තාක්ෂණ පද්ධතිය සංවර්ධනය කිරීම යටතේ ස්ථාපිත කර ඇති වෙබ් අඩවිය ඔස්සේ දායක ගිණුම් පිළිබඳ තොරතුරු ලබාගැනීමේ පහසුකම සලසා දීම, එස්.එම්.එස් මගින් දායකයින් වෙත තොරතුරු සැපයීම යන කාර්යයන් සැලසුම් කර තිබුණද එම සැලැසුම් ඉටු කර නොතිබුණි.

(උ) සේවා කටයුතු විමධ්‍යගත කිරීම දිස්ත්‍රික් කාර්යාල සංවර්ධනය යටතේ මන්නාරම හා මුලතිව් දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් කාර්යාල ස්ථාපිත කිරීමට හා යෝජනා ක්‍රම සඳහා දායකයින් බඳවා ගැනීමට සැලසුම් කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඌ) අක්‍රිය දායකයින් සක්‍රිය කිරීම යටතේ 2013 වර්ෂය තුලදී අක්‍රිය දායකයින් 10,000 ක් සක්‍රිය කිරීමට සැලසුම් කර තිබුණද අක්‍රිය දායකයින් සක්‍රිය කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් වැඩසටහන් 52 ක් සංවිධාන කර සක්‍රිය කිරීම් 922 ක් පමණක් සිදුකර තිබුණි. එය සැලැසුම් ගත සංඛ්‍යාවෙන් සියයට 9 ක් පමණි. එමෙන්ම මේ යටතේ සාමාජිකයින්ට ගිණුම් ප්‍රකාශ ලබාදීම, අක්‍රිය සාමාජිකයන් වෙත සක්‍රිය කිරීමේ නිවේදන යැවීම, මාධ්‍ය මගින් පොදු දැනුවත් කිරීම් ආදිය සැලසුම් කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩල පනතේ IV වන කොටසෙහි 21(2) (ආ) හා (ඇ) වගන්තිය ප්‍රකාරව, දායක මුදල් හා ආයෝජන පොලී සහ ලාභ වශයෙන් උපයන සියළුම මුදල් මණ්ඩලයේ අරමුදලට බැර කළ යුතුය. එහෙත් මණ්ඩලය විසින් සමාජ ආරක්ෂණ දිරි දීමනා හා සමාජ ආරක්ෂණ සංවර්ධන අරමුදල නමින් අරමුදල් පිහිටුවා එකතු කරනු ලබන දායක මුදල් වෙනුවෙන් ගෙවනු ලබන දිරි දීමනා හා දායකයින් දැනුවත් කිරීම සඳහා දරනු ලබන වියදම් එම අරමුදල්වලින් වැය කර තිබුණි.

**4.3 කාර්ය මණ්ඩල පරිපාලනය**

2013 දෙසැම්බර් 31 දින වන විට කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 45 ක් පැවති අතර එම පුරප්පාඩු පිරවීමට අදාල කටයුතු මණ්ඩලය විසින් ආරම්භ කර තිබුණද මෙතෙක් බඳවා ගැනීම් සිදු කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.1 ඡේදය පරිදි මණ්ඩලය විසින් 2012 සිට 2016 දක්වා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද, එය චක්‍රලේඛයෙහි 5.1.2 ඡේදයෙහි සඳහන් කරුණුවලට අනුකූලව පිළියෙල කර නොතිබුණි.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

2013 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම , සංයුක්ත සැලැස්මේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමට හැකිවන ආකාරයෙන් කාර්යයන් කාලානුරූපීව බෙදා වෙන්කර එක් එක් කාර්යය සඳහා වගකිව යුතු නිලධාරීන් සඳහන් කරමින් ක්‍රමවත්ව පිළියෙල කර නොතිබුණ අතර සංයුක්ත සැලැස්මේ සඳහන් කාර්යයන් ඉටුකර ගත හැකි ආකාරයෙන් විස්තරාත්මකව පිළියෙල කර නොතිබුණි.

**5.3 අභ්‍යන්තර විගණනය**

මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර තිබු අතර 2013 පෙබරවාරි 14 වන දින අභ්‍යන්තර විගණන නිලධාරි ඉවත් වීමෙන් පසු 2013 පෙබරවාරි 15 දින සිට වැඩබලන අභ්‍යන්තර විගණන නිලධාරියෙකු විසින් විගණන කටයුතු සිදු කර තිබුණි.

**5.4 අයවැය ලේඛනමය පාලනය**

2013 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන චක්‍රලේඛයේ 5.2 වගන්තිය පරිදි මණ්ඩලය විසින් 2013 වර්ෂය සඳහා අයවැය ලේඛණයක් සකස් කර එය නැවත සංශෝධනය කර තිබුණු නමුත්, 2014 පෙබරවාරි වන විටත් එම සංශෝධිත අයවැය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. මේ නිසා අයවැය ප්‍රධාන පාලන උපක්‍රමයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂයක් අවසන් වී දින 150 ක් ඇතුලත වාර්ෂික වාර්තා හා ගිණුම් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු

වුවත් 2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණේ 2014 මැයි 20 දිනදීය.

**6. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

(අ) දායකයින් බඳවා ගැනීම හා ලේඛනගත කිරීම
(ආ) වාරික මුදල් අය කිරීම හා ගිණුම්ගත කිරීම
(ඇ) විශ්‍රාම වැටුප් ගෙවීම හා ගිණුම්ගත කිරීම
(ඈ) අත්තිකාරම් පාලනය
(ඉ) බැංකු ගිණුම් පාලනය